# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2348/36 - 2023 සැප්තැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2023.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී. වී. 66705 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන, කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ I වන උපලේඛනයේ, I වන කොන්දේසිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

1. කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංරචක මගින් සම්පූර්ණ කළ යුතු (SLQF 10 වන මට්ටම) කළමනාකරණ උපායමාර්ග පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති උපාධිය සම්බන්ධයෙන් -

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශය විසින් පිළිගත්, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගිණුම්කරණය, මූල්‍යය, වතු කළමනාකරණය, සහ තක්සේරුකරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන සම්භාර 30 ක් ඇතුළත් ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ

(ආ) ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය. ගිණුම්කරණය. මූල්‍යය, වතු කළමනාකරණය සහ තක්සේරුකරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ SLQF 6 වන මට්ටමේ හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ඇ) SLQF 6 වන මට්ටමට සමාන හෝ ඊට ඉහළ වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ඈ) එම විශේෂඥ ක්ෂේත්‍රයට ඇතුළත් වීම සඳහා නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි GPA අගය 0 - 4 පරිමාණයකින් අවම වශයෙන් 3.0 ක අගයක් සහිතව තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් NVQ 7 වන මට්ටම සම්පූර්ණ කර තිබීම; හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශය විසින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහිත සහ එම සුදුසුකම ලැබීමෙන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්ද ලබා තිබීම; හෝ

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශය විසින් පිළිගත් වසරකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ වෙනත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උසස් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්ද ලබා තිබීම; හෝ

(උ) පහත සඳහන් වෘත්තීය සුදුසුකමක් සමග එම සුදුසුකම ලැබීමෙන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්ද ලබා තිබීම:-

(i) ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් පිරිනමන අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව (SLIM); හෝ

(ii) වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (IPM) විසින් පිරිනමන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0059/1

---

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන, ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්. එකී පනත යටතේ සාදනු ලැබූ 2019 මාර්තු මස 26 වැනි දින අංක 2116/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ I වන උප ලේඛනයේ කොන්දේසිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය විසින්, ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි (SLQF 06 වන මට්ටම) සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

(a) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ ("ඉංග්‍රීසි" විෂයය ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් විය යුතුය) සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම, හෝ

(b) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය විසින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඉංග්‍රීසි ගුරු අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

ආචාර්ය ඒ. ඩී. **සුසිල් ප්‍රේමජයන්ත**,
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0059/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.